**ජාතික අධ්‍යාපන ආයතනය**
**ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2019/2020

## අයදුම්පත් කැඳවීම (සිංහල මාධ්‍යය)

ජාතික අධ්‍යාපන ආයතනය මගින් මෙහෙයවනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා සිංහල මාධ්‍ය පාඨමාලාලාභීන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

1.0 අවශ්‍ය සුදුසුකම්

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් ලබාගත් ප්‍රථම උපාධියක් සහිත වීම

**සහ**

(ඇ) රජයේ හෝ අර්ධ රාජ්‍ය පාසලක / පිරිවෙනක / රජය අනුමත වෙනත් ආගමික අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු විදුහල්පතිවරයකු (ශ්‍රී.ල.වි.සේ) / ගුරුවරයකු (ශ්‍රී.ල.ගු.සේ) හෝ ගුරු උපදේශකවරයකු / ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ කථිකාචාර්යවරයකු /ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නියුතු නිලධාරියකු / ජාතික අධ්‍යාපන ආයතනයේ හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර හා අඛණ්ඩ සේවයේ නියුතු සාමාජිකයෙකු වීම

**සහ**

2019.08.20 දිනට වයස අවුරුදු 52 හෝ ඊට අඩු වීම

2.0 මෙම පාඨමාලාව සති අන්ත සහ පාසල් නිවාඩු කාල වල දී පවත්වනු ලබන අර්ධ කාලීන මාස 18ක පාඨමාලාවකි.

3.0 පාඨමාලාව පැවැත්වෙන ප්‍රාදේශීය මධ්‍යස්ථාන

| අනු අංක | ප්‍රාදේශීය මධ්‍යස්ථානය | අනු අංක | ප්‍රාදේශීය මධ්‍යස්ථානය |
|---|---|---|---|
| 1 | මහරගම | 16 | මොනරාගල |
| 2 | ගම්පහ | 17 | බිබිල |
| 3 | කළුතර | 18 | කැකිරාව |
| 4 | ඇඹිලිපිටිය | 19 | පොළොන්නරුව |
| 5 | රත්නපුරය | 20 | අනුරාධපුරය |
| 6 | කෑගල්ල | 21 | නිකවැරටිය |
| 7 | බලංගොඩ | 22 | හලාවත |
| 8 | මාතලේ | 23 | කුරුණෑගල |
| 9 | මහනුවර | 24 | කුලියාපිටිය |
| 10 | පේරාදෙණිය | 25 | අම්පාර |
| 11 | නුවරඑළිය | 26 | තංගල්ල |
| 12 | බදුල්ල | 27 | මාතර |
| 13 | බණ්ඩාරවෙල | 28 | ගාල්ල |
| 14 | මහියංගනය | 29 | හම්බන්තොට |
| 15 | ත්‍රිකුණාමලය | | |

4.0 අවම වශයෙන් සුදුසුකම් ලැබූ පාඨමාලාලාභීන් පනස්දෙනෙකුවත් නොමැති මධ්‍යස්ථානවල පාඨමාලාව පවත්වනු නො ලැබේ. එවැනි මධ්‍යස්ථානයක් ඉල්ලුම් කළ අයදුම්කරුවන්ට තම මනාපය පරිදි දෙවැනි මධ්‍යස්ථානය තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙනු ඇත. අයදුම්කරු විසින් තෝරා ගන්නා ලද මධ්‍යස්ථාන පසුව වෙනස් කිරීමට අවසර දෙනු නො ලැබේ. (මේ පිළිබඳ අවසාන තීරණය අධ්‍යක්ෂ ජනරාල් සතු ය.)

5.0 පාඨමාලා ගාස්තු

අයදුම් කිරීමේ ගාස්තුව රුː 1000/- කි. ලියාපදිංචි ගාස්තුව රු. 1500/-කි. පාඨමාලා ගාස්තුව රු. 60,000/-කි. පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකි ය. පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ ලියාපදිංචි ගාස්තුව හා පළමු වාරිකය ගෙවිය යුතු ය. (ලියාපදිංචි ගාස්තුව රු. 1500/-, පළමු වාරිකය රු. 40,000/-). ඉහත ගාස්තුවට අමතරව අවසාන විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව ද ගෙවිය යුතු ය. (පාඨමාලා සහ විභාග ගාස්තු පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල් සතු ය.)

6.0 පාඨමාලාවට තෝරා ගැනීම

ලිඛිත පරීක්ෂණයක් පවත්වා ඉන් සුදුසුකම් ලැබූවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් හෝ සම්මුඛ පරීක්ෂණය මගින් පමණක් සුදුස්සන් තෝරා ගනු ලැබේ. **සම්මුඛ පරීක්ෂණයයේ දී සේවා කාලය පිළිබඳ ව සැලකිල්ලක් දක්වනු ලැබේ.**

7.0 අයදුම් කරන පිළිවෙළ

(අ) මෙහි සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කොළයක තනි පිටුවක සකස් කරන ලද අයදුම්පතක්, ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ජාතික අධ්‍යාපන ආයතනයේ **අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 607628** ට රු. 1000/-ක මුදලක් බැරකර ලබාගත් කුවිතාන්සියේ මුල් පිටපත සහ නම හා ලිපිනය ලියූ රුː 15/-ක් වටිනා මුද්දර ඇළවූ 9'x 4' ප්‍රමාණයේ ලියුම් කවරයක් ද සමඟ **2019.08.20** දිනට පෙර

**ජාතික සම්බන්ධීකාරක,**
**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව,**
**ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම 10280**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. මුදල් ගෙවීමේ දී මුදල් ඇණවුම් හෝ ලංකා බැංකුව හැර වෙනත් බැංකුවකට බැර කරන ලද මුදල් හෝ භාර ගනු නොලැබේ.

(ආ) ඔබ පාසලේ විදුහල්පති/ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද උපාධි සහතිකයේ හා පත්වීම් ලිපියේ ඡායා පිටපතක් (A4 ප්‍රමාණයේ) අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතු ය.

(ඉ) **2019.08.20** දිනට පසුව ලැබෙන අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, සහතිකවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.0 තෝරාගන්නා පාඨමාලාලාභීන් ප්‍රායෝගික ගුරු පුහුණුව සඳහා සති 14ක් ඉගැන්වීමේ කාර්යයේ නිරත විය යුතු ය. ගුරු සේවයේ නිරත නොවන අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් මේ සඳහා සුදුසු පාසලක් තෝරාගත යුතුයි.

9.0 ඉල්ලුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" PGDE 2019/S "** යනුවෙන් සඳහන් කරන්න.

ආදර්ශ අයදුම්පත් සහ විස්තර **www.nie.lk** වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකි ය.

කාර්යාල දිනයන්හි පස්වරු 01.00 සිට 03.00 දක්වා දුරකථන අංක **0117-601745** ඇමතීමෙන් වැඩිවිස්තර ලබාගත හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**Source: www.nie.lk (2019.07.29)**